# ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව යනු රටේ රාජ්‍ය අංශයේ විද්‍යාඥයින් සඳහා මූල්‍යමය සහාය සපයන රජයේ ආධාර ලබන ආයතනයකි.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ (NRC) පහත පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## විද්‍යාත්මක/ පර්යේෂණ නිලධාරී - AR 1 - තනතුරු 01

**රැකියා විස්තරය :**

සභාවේ ප්‍රදාන කළමනාකරණය, ප්‍රදාන පිළිබඳ තොරතුරු පළකිරීම, දත්ත ගබඩා පවත්වාගෙන යාම (Database), සංඛ්‍යානමය විශ්ලේෂණය, වාර්තා සකස් කිරීම සහ අවශ්‍ය කෙරෙන රැස්වීම් සහ සම්මන්ත්‍රණ/ වැඩමුළු වැනි අවස්ථා සම්බන්ධීකරණය කිරීම.

**සුදුසුකම්**

01. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂි විද්‍යාව, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT), පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක විශේෂවේදී උපාධියක්

හෝ

02. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂි විද්‍යාව, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT), පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක සාමාන්‍ය උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්.

**වයස** : වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : AR1-2016 (රු. 53,150 - 1375x10-1910x15-95,550/-)

**ඉහත තනතුර සඳහා අදාළ අනෙකුත් කොන්දේසි**

01. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
02. තනතුරෙහි රාජකාරීන් මනාව ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අයදුම්කරුවන් කායිකව සහ මානසිකව සෞඛ්‍ය සම්පන්න විය යුතුය.
03. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
04. බඳවාගැනීම තරගකාරී ලිඛිත පරීක්ෂණයක් සහ/ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ.
05. මෙම පත්වීම ස්ථිර පත්වීම් වන අතර, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකම් තියයි.
06. ජාතික පර්යේෂණ සභාවේ සේවකයින්ට අදාළ අනෙකුත් අමතර ප්‍රතිලාභ ද මේ පත්වීම සඳහා වලංගු වේ.
07. අයදුම්කරුවන් තම අත්සන සහිත අයදුම්පත්‍ර, උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් අදාළ සහතික පත්‍රවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර, ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් හෝ කුරියර් සේවාව මගින්, **"සභාපති, ජාතික පර්යේෂණ සභාව, 120/7, විද්‍යා මාවත, කොළඹ 07"** යන ලිපිනයට 2022 අප්‍රේල් 20 වන දිනට හෝ ඊට පෙර එවන්න.
08. තැපැල්/ කුරියර් සේවා ප්‍රමාදවීම් මගහරවා ගැනීමට ඔබගේ අයදුම්පත්‍රයේ ස්කෑන්කළ පිටපතක් admin@nrc.gov.lk වෙත ඊමේල් කළ යුතුය. අයදුම්පත්‍රයේ සියලුම පිටු අයදුම්කරු විසින් අත්සන් තබා එවිය යුතුය.
09. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානී හරහා එවිය යුතුය.
10. ඉහත අවශ්‍යතාවයන් සමග අනුකූල නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වනු ඇත.

මෙම දැන්වීම NRC වෙබ් අඩවිය වන www.nrc.gov.lk හිද පළ කර ඇත.

**සභාපති,**
**ජාතික පර්යේෂණ සභාව, 120/7, විද්‍යා මාවත, කොළඹ 07.**
**දු.ක. 0112-675176, ෆැක්ස් : 0112-675136**
**ඊමේල් :** admin@nrc.gov.lk